GMOA

ESTABLISHED IN 1926

TU No. 291

THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION

No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580886 / 2055415 / 0718552552

Fax : 4518668 / 2503586

Web : www.gmoa.lk

Email : info@gmoa.lk
office@gmoa.lk


2025.11.11

මාධ්‍ය නිවේදනය

**අයවැය - 2026 මඟින් සෞඛ්‍ය සේවය සහ වෛද්‍යවරුන් නොසලකා හැරීම තුල ඇති වී තිබෙන අහිතකර තත්ත්වයත්, ඉදිරි ක්‍රියාමාර්ගත් සාකච්ඡා කිරීමට කැඳ වූ රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ හදිසි මධ්‍යම කාරක සභා රැස්වීමේ තීරණ.**

මානව සම්පත් අර්බුදය, ඖෂධ සහ උපකරණ හිඟය, රෝගී සත්කාර සේවාවන් සැපයීමට අවශ්‍ය පහසුකම් නොමැති වීම සහ රෝගීන්ට අවශ්‍ය මූලික පහසුකම් නොමැතිවීම ඇතුළු ගැටලු ගණනාවක් හේතුවෙන් පවතින තත්ත්වයෙන්ම මෙරට නිදහස් සෞඛ්‍ය පද්ධතිය ඉදිරියට පවත්වා ගැනීම දැඩි ගැටලුකාරී තත්ත්වයකට පත්ව ඇති බව නොරහසකි.

මෙම ගැටලු පිළිබඳ ජනාධිපතිතුමා, සෞඛ්‍ය ඇමතිතුමා, මුදල් අමාත්‍යාංශ ලේකම්තුමා ඇතුළු වගකිවයුතු පාර්ශව දිනෙන් දින දැනුවත් කරමින්, එම ගැටළු විසඳීම සඳහා තිරසාර වැඩපිළිවෙලක අවශ්‍යතාවය රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය විසින් පෙන්වා දෙන ලදී. එහිදි, ඉල්ලීම් කිහිපයක් කර තිබියදීත්, නිදහස් සෞඛ්‍ය සේවයේ ගැටළු සාකච්ඡා කිරීමට ජනාධිපතිතුමාගේ පාර්ශවයෙන් සාකච්ඡාවක් ලබා නොදීමද අවධානයට ලක්වුණු කරුණකි.

එවන් පසුබිමක, පසුගිය සතියේදී ජනාධිපතිතුමා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන අයවැය 2026 තුල ශ්‍රී ලාංකේය නිදහස් සෞඛ්‍ය සේවාවට හිමි වී ඇති ස්ථානය පිළිබඳ ගැටලුකාරී තත්ත්වයක් මතුව තිබේ.

ජනාධිපතිතුමාටම අනුව ආර්ථික අර්බුදය විසදී රට නැවත ප්‍රකෘතිමත් තත්ත්වයට ළඟාවෙමින් සිටින මොහොතක සහ මුදල්වලින් මහා භාණ්ඩාගාරය ඉතිරි යමින් පවතින මොහොතක ඉදිරිපත් කරන ලද මෙම අයවැය ලේඛනය තුළ, රාජ්‍ය සෞඛ්‍ය සේවාව සහ රෝහල් පද්ධතිය ආරක්ෂා කර ගනිමින් ශක්තිමත් කරගැනීම උදෙසා විධිමත් වැඩපිළිවෙළක් ප්‍රකාශයට පත් වී නැත.

සෞඛ්‍ය සේවාව සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති යෝජනා විශ්ලේෂණය කරන විට අපට හැඟී යන්නේ, සෞඛ්‍ය සේවාවේ සැබෑ ගැටලු කිසිවකට මෙම අයවැයෙන් විසඳුම් ලබාදී නොමැති බවයි. ඒ තුළ ගම්‍ය වන්නේ වත්මන් පාලනය මෙරට සෞඛ්‍ය සේවාවේ සැබෑ ගැටළු කිසිවක් හඳුනාගෙන නොමැති බවයි.

ඖෂධ සහ උපකරණ වෙනුවෙන් දැවැන්ත මුදලක් වෙන් කරතිබුණද, ප්‍රමිතිගත ඖෂධ අඛණ්ඩව සැපයීමේ ක්‍රියාවලියට බාධා වී ඇති කරුණු හඳුනා ගනිමින් ඒ වෙනුවෙන් නිශ්චිත වැඩපිළිවෙළක් දියත් කිරීම සඳහා කිසිදු යෝජනාවක් මෙම අයවැය තුළ අන්තර්ගත වී නොමැත. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඩිජිටල්කරණය, ජාතික ඖෂධ තත්ත්ව නියාමන විද්‍යාගාරයක් ස්ථාපිත කිරීම වැනි ප්‍රධාන කරුණු කිසිවක් අයවැය තුළින් සලකා බලා නැත.

රෝහල් පද්ධතිය තුල දැවැන්ත ගොඩනැගිලි ඉදිකිරීම වෙනුවෙන් විශාල මුදලක් වෙන්කර තිබුනද, රෝගී සත්කාර සේවා පවත්වාගැනීමට අවශ්‍ය පහසුකම් ලබාදීමට හෝ මානව සම්පත රැක ගැනීමට නිශ්චිත වැඩපිළිවෙළක් ප්‍රකාශයට පත් වී නැත.

මෙවර අයවැය හරහා වෛද්‍යවරුන්ට, සෞඛ්‍ය සේවාවට සහ රටට සිදු කර ඇති දැවැන්තම අසාධාරණය වනුයේ, රට තුළ සහ රාජ්‍ය සෞඛ්‍ය පද්ධතිය තුළ රැඳී සිටීම දිරිමත් කිරීම සඳහා කිසිදු යෝජනාවක් අඩංගු නොවීමයි.

රට තුල පැවති අර්බුදකාරී වාතාවරණය හමුවේ සියලු අපහසුතා දරාගනිමින් මව්බිම තුළ රැඳී සිටි වෛද්‍යවරුන් ඇතුලු වෘත්තියවේදීන්ට කිසිදු සාධාරණයක් ඉටු කිරීමට අසමත් වීම ඓතිහාසික වරදක් බව අපගේ හැඟීමයි.

මෙම අයවැය යෝජනාවලිය හේතුවෙන් මෙරට සමස්ත වෛද්‍ය ප්‍රජාව අතර දැඩි විරෝධයක් සහ කලකිරීමක් ඇතිවී තිබෙන අතර, රෝහල් පද්ධතිය පවත්වාගෙන යාම සම්බන්ධයෙන් දැඩි අර්බුදයක්ද මතු වෙමින් පවතී.

අයවැය - 2026 ට සමගාමීව ඇති වී තිබෙන තත්ත්වයත්, ඉදිරි වෘත්තීය ක්‍රියාමාර්ගත් සම්බන්ධයෙන් සාකච්ඡා කර තීන්දු තීරණ ගැනීම සඳහා රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ මධ්‍යම කාරක සභාවේ හදිසි විශේෂ රැස්වීමක් අද දිනයේදී පැවැත්විණ.

එහිදී වෘත්තීය සමිති ක්‍රියාමාර්ග ලෙස ක්‍රියාත්මක කිරීමට නියමිත පහත තීරණවලට එළඹෙන ලදී.


1. සෞඛ්‍ය පද්ධතියේ අර්බුදයට විසඳුම් ලබා දීම අයවැයේදී නොසලකා හැරීම පිළිබඳ දේශපාලන පක්ෂ නායකයින්, ආගමික නායකයින්, සිවිල් සංවිධාන සහ මහජනතාව දැනුවත් කිරීම.
2. රෝහල තුල නොමැති ඖෂධ, උපකරණ සහ රසායනාගාර පරීක්ෂණ බාහිරින් ලබා ගැනීම හෝ සිදු කරගැනීම සඳහා රෝගීන්ට නිර්දේශ කර තුණ්ඩු නිකුත් කිරීම අත්හිටුවීම.
3. දේශපාලන කණ්ඩායම් විසින් සංවිධානය කරනු ලබන සෞඛ්‍ය කඳවුරු සහ සායන සඳහා ස්වෙච්ඡාවෙන් සහභාගිවීමෙන් ඉවත් වීම.
4. ප්‍රමාණවත් වෛද්‍යවරුන් නොමැතිව රෝහල් පද්ධතිය තුල විවෘත කරන නව රෝහල් වාට්ටු සහ ඒකක වලට වෛද්‍යවරුන් අනුයුක්ත කිරීම අත්හිටුවීම.
5. රෝගීන්ගේ ආරක්ෂාව සහ පෞද්ගලිකත්වය සපුරාලීමට අවශ්‍ය ප්‍රමාණවත් පහසුකම් සහ සහායක කාර්යමණ්ඩලය නොමැතිව රෝගීන් පරීක්ෂා කිරීමෙන් ඉවත් වීම.

එළඹෙන සතිය වන විට මෙම ගැටළු පිළිබඳ රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය සමඟ සාකච්ඡා කර විසඳුම් ප්‍රකාශයට පත් කිරීමට ජනාධිපතිතුමා ඇතුලු වගකිව යුත්තන් අසමත් වන්නේ නම්, දිස්ත්‍රික් සහ පළාත් මට්ටමින් විරෝධතා ව්‍යාපාර පැවැත්වීමටද තීරණය කරන ලදී.

නිදහස් සෞඛ්‍ය සේවාව මුහුණ දී ඇති ගැටළු විසඳීම සඳහා අවශ්‍ය තරම් කාලය සහ විකල්ප ලබා දී තිබියදීත් ජනාධිපතිතුමා සහ රජය ඒ වෙනුවෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග නොගන්නේ නම් මෙම වෘත්තීය ක්‍රියාමාර්ග ඉදිරියේදි තවදුරටත් තිව්‍ර කිරීමටද තීරණය කරන ලදී.

ජනතාවගේ ජිවත් වීමේ අයිතිය සුරක්ෂිත කරන නිදහස් සෞඛ්‍ය සේවාව බිඳ වැටීම වළක්වා රෝහල් පද්ධතිය සුරක්ෂිත කිරීම ඉහළ ප්‍රමුඛතාවයක් සේ සලකා අවශ්‍ය මැදිහත් වීම් සිදු කර ගැටළු විසඳීම සඳහා ජනාධිපතිතුමා වහාම මැදිහත් විය යුතු යැයි අපි විශ්වාස කරමු.

ස්තුතියි.
මීට විශ්වාසී,



වෛද්‍ය ප්‍රභාත් සුගතදාස,
ලේකම්.

වැඩිදුර විස්තර රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමයේ මාධ්‍ය කමිටුවෙන් -

| | | |
|---|---|---|
| වෛද්‍ය චමිල් විජේසිංහ(මාධ්‍ය ප්‍රකාශක) | - | 0717080041 |
| වෛද්‍ය පාලිත රාජපක්ෂ | - | 0718480300 |
| වෛද්‍ය අජන්ත රාජකරුණා | - | 0766736296 |
| වෛද්‍ය වසන්ත වීරසූරිය ආරච්චි | - | 0773526063 |
| වෛද්‍ය හංසමාල් වීරසූරිය | - | 0776549339 |
| වෛද්‍ය තෙනුවන් වික්‍රමසිංහ | - | 0777829001 |
| වෛද්‍ය චාරුනි කොහොඹන්ගේ | - | 0714410467 |
| වෛද්‍ය අන්ෆාස් ෆාරූක් | - | 0771115117 |
| වෛද්‍ය ආර්. තනිගවාසන් | - | 0772369608 |
| වෛද්‍ය ප්‍රසාද් කොළඹගේ | - | 0716812160 |
| වෛද්‍ය සංජීව තල්ගහගොඩ | - | 0716173330 |